## නර්තනයේ ප්‍රවර්ධනයට  දායක වූ ශිල්පිනියන් .

දේශීය නර්තන කලාවට ඇත්තේ දීර්ඝ ඉතිහාසයකි. එම දීර්ඝ කාලය තුල දේශීය නර්තන කලාව නොනැසී පැවත ඒමට බලපාන එක කරුණක් වන්නේ අතීතයේ සිට එක් එක් යුගවල බිහිවූ නර්තන ශිල්පිනියන් හා ශිල්පීන් ය. ඔවුන් විසින් නර්තන කලාවේ ප්‍රවර්ධනයට ඇපකැප වීම, දේශීය නර්තන කලාවේ පෝෂණයට උරදීම ආදී විශිෂ්ට කාර්යන් සිදු කරන ලදී. එනිසා එම ශිල්පීන් හා ඔවුන් නර්තන කලාවට ඉටු කළ සේවාව කළ ගුණ දන්නා ජාතියක් ලෙස සිහිපත් කිරීම අපගේ යුතුකමකි.

## නර්තනයේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පිනියන් .



වජිරා චිත්‍රසේන මහත්මිය



මිරැන්ඩා හේමලතා මහත්මිය

The National e-learning Portal for

## 01. මිරැන්ඩා හේමලතා මහත්මිය



දේශීය නර්තන කලාවෙන් මෙන්ම භාරතීය නර්තන සම්ප්‍රදායෙන් ද ප්‍රවීණ දැනුමක් ඇති ප්‍රකට නර්තන ශිල්පිනියක් ලෙස මිරැන්ඩා හේමලතා මහත්මිය හැඳින්විය හැක. විවිධ ක්ෂේත්‍රයන් කෙරෙහි පුළුල් දැනුමක් ඇති ඇය දක්ෂ නර්තන ශිල්පිනියෙකි. මුද්‍රා නාට්‍ය ශිල්පිනියෙකි. පරිපාලන නිලධාරිනියෙකි. එසේම පළපුරුදු අධ්‍යාපනඥවරියෙකි.

අන්තර්ගතය - පුෂ්පා තලමුල්ලගේ මිය - ර/ඇඹිලිපිටිය ම.වි
සැකසුම - Y.M.S.S.බාලසූරිය මෙනවිය -රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය.

1938.11.15 පානදුරේ උපත ලද ඇය රජයේ කලායතනයේ උඩරට නර්තන ශිල්පය ප්‍රගුණ කලාය. රජයේ ශිෂ්‍යත්වයක් ලැබූ ඇය භාරතයට ගොස් භාරත නාට්‍යම් නර්තන සම්ප්‍රදාය ද මනා ලෙස ප්‍රගුණ කොට දක්ෂ නාට්‍ය ශිල්පිනියක් ද වූවාය. මිරැන්ඩා හේමලතා මහත්මිය විසින් දේශීය නර්තන කලාවට ඉටුකළ මෙහෙය අතිමහත් ය.

- ඇය කටුකුරුන්ද ගුරු අභ්‍යාස විද්‍යාලයෙහි ද, ගිරාගම ගුරු විද්‍යාලයෙහිද කථිකාචාර්යවරියක් ලෙස සිසුන්ට දැනුම ලබා දීම.
- අධ්‍යාපන අමාත්‍යාංශයෙහි නර්තන විෂය අධ්‍යක්ෂකවරිය ලෙස කටයුතු කරමින් නර්තන විෂය මාලාව, නර්තන ඉගැන්වීමේ ක්‍රම පවතින යුගයෙහි අවශ්‍යතාවයට අනුව සකස් කිරීම.
- ජාතික අධ්‍යාපන ආයතනයෙහි සෞන්දර්ය දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂකවරිය ලෙස කටයුතු කරමින් මීපේ සෞන්දර්ය ආයතනය ඉදිකිරීමට පුරෝගාමී වීම.
- ගුරු අධ්‍යාපනය විධිමත් කිරීමටත් ගුරුවරුන්ගේ දැනුම යාවත්කාලීන කිරීමටත්, විවිධ වැඩසටහන් සම්පාදනය කිරීම ආදී සේවාවන් ඇය විසින් කළ සේවාවට කදිම නිදසුන් ය.
- ස්වර්ණතිලකා, තණ්හා ආශා වැනි ඉඟි නළු නිර්මාණය කළ ඇය ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට මන්ද මානසික දරුවන් සඳහා නර්තනය ඉගැන්වීම ආරම්භ කොට ඔවුන්ගේ ජීවිත වලට නව එළියක් ලබා දෙන්නී ය.
- මෙසේ නර්තන අධ්‍යාපනයේ උන්නතියට විශාල මෙහෙවරක් ඉටුකළ මිරැන්ඩා හේමලතා මහත්මිය මේ වන විටද දේශීය නර්තනයේ උන්නතියට උර දෙමින් සිටින ගුරු මාතාවකි.



අන්තර්ගතය - පුෂ්පා තලමුල්ලගේ මිය - ර/ඇඹිලිපිටිය ම.වි
සැකසුම - Y.M.S.S.බාලසූරිය මෙනවිය -රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය.